Australian Bureau of Statistics

census
8 August 2006

# Fact Sheet

www.abs.gov.au/census

## අගෝස්තු 08 වන දින පැවැත්වෙන 2006 සංගණනය ඔබේ ප්‍රජාව කෙරෙහි වැදගත්වේ

ඔස්ට්‍රේලියාවේ සිටින සියල්ලෝම 2006 ජනගහණ සහ නිවාස සංගණනයේදී ගණනයට භාජනය වෙති. ඔබ ප්‍රජාවේ මතු යහපත උදෙසා ඔබේ සහය අතිශය වැදගත් වේ.

ප්‍රජා සංවිධාන, රජය සහ ව්‍යාපාරයන් නිවාස, සෞඛ්‍ය, අධ්‍යාපන, භාෂා සේවාවන් සහ විශේෂ ආධාර වැඩසටහන් වැනි ප්‍රජා පහසුකම් සහ සේවා සැලසුම් කරනු වස්, සංගණන තොරතුරු කෙරෙහි විශ්වාසය තබති.

## උපන් ස්ථානය, කථාකරන භාෂාවන්, ආගම සහ පෙළපත පිළිබඳ ගැටළු

2006 සංගණනය ඔස්ට්‍රේලියාව තුල සිටින සැමදෙන පිළිබඳ මනා සංක්ෂිප්ත අධ්‍යයනයක් වන්නාසේම වයස, උපන් ස්ථානය, කථා කෙරෙන භාෂාවන්, ආගම් සහ පෙළපත් වැනි වැදගත් අංගයන් අධ්‍යයනය කරන අතරම ජනතාවට ඉංග්‍රීසි බස සඳහා සහය අවශ්‍යද යන්නද සොයා බලනු ඇත.

වාර්ගික ප්‍රජා සංවිධානයන්ද මේ සංගණනය අනුමත කරති. සංගණන පෝරමයේ සඳහන්වන තොරතුරු ඔවුනගේ ප්‍රජාවන් පිළිබඳ නිවැරදි චිත්‍රයක් ලබාදීමේ ලා සහය වේ. රජයේ අරමුදල් වාර්ගික ප්‍රජාවන් සඳහා සාධාරන ලෙස වෙන්කිරීමේදී ද සංගණන තොරතුරු ඉවහල් වනු ඇත.

## එය ලැයිස්තු ගතකොට නැති නම් ඔබේ පිළිතුරු සපයන්න

මේ සංගණනය දළ වශයෙන් රටවල් 280ක්, භාෂා 240ක්, ආගම් 120ක් පිළිබඳ තොරතුරු ලේඛන ගත කරයි. සංගණන පෝරමයේ ඉඩකඩ සීමිත හෙයින් සියළුම රටවල්, භාෂා සහ ආගම් ලැයිස්තු ගත කිරීමට නොහැකිය. ඔබේ රට, භාෂාව හෝ ආගම ලැයිස්තු ගත කොට නොමැති නම් කරුණාකර ඔබේ පිළිතුර සපයා ඇති හිස් තැනෙහි සටහන් කරන්න.

## මා සපයන තොරතුරු පුද්ගලිකද ?

**සංගණනයෙන් රැස්කෙරෙන තොරතුරු සියල්ල නීති ප්‍රකාරවම රහසිගතය**. ඔබේ පූර්ණ පුද්ගලික රහස්‍යභාවය සහතික වනු ඇත.

ඔබ සංගණන කාල කොපුවෙහි කොටස් කරුවකු වීම සඳහා තෝරා ගත්තේ නම් හැර කිසිදු නමක් හෝ ලිපිනයක් පිළිබඳ තොරතුරු ගබඩා නොකෙරේ. සියළුම නම් හෝ ලිපිනයන් හි තොරතුරු රැගත් සංගණන කඩදාසි පෝරම සහ යම්කිසි පරිඝනක ලිපිගොනු, දත්ත සැපයීමෙන් පසු විනාශ කර දමනු ලැබේ.

සියළුම සංගණන සේවක සේවිකාවන් කිසිදා පුද්ගලික තොරතුරු හෙලිකිරීමෙන් වැලකීම සඳහා නීතියෙන් බැඳී ඇත. පොලීසිය, ASIO, බදු කාර්යාලය, Centrelink, ආගමන දෙපාර්තමේන්තුව සහ ස්වාධීන වෙළඳ සමාගම් වැනි ආයතනයන්ට සංගණන තොරතුරු කිසිදිනෙක ලබාගත නොහැක.

## Census Time Capsule
## (සංගණන කාල කොපුව)

ඔබේ නමත්, ලිපිනයත් සමග ඔබේ සංගණන තොරතුරු, National Archives of Australia (ඔස්ට්‍රේලියානු ජාතික ලේඛන සංරක්ෂණාගාරය) හි අවුරුදු 99කට සුරක්ෂිතව තැන්පත් කිරීමට තීරණය කල හැක. අවුරුදු 99කට කිසිවෙකුට මෙකී සංගණන තොරතුරු වලට ප්‍රවේශ වීමට නොහැකි හෙයින්, මේ ව්‍යාපෘතිය සංගණන කාල කොපුව ලෙස නම් කෙරින.

වසර 2105 දී, ජාතික ලේඛන සංරක්ෂණාගාරය කාල කොපුවෙහි ඇති තොරතුරු මහජනතාවට මුදාහරිනු ලබන අතර, අනාගත පරම්පරාවන් හට තම පෙළපත් සටහන් පිළිබඳ හෝඩුවාවන් ලබාගැනීමටද මින් හැකි වනු ඇත.

**සංගණන කාල කොපුව සඳහා සහභාගීවීම සම්පූර්ණයෙන්ම සිය මනාපය පරිදි සිදුවිය යුතු දෙයකි.** ව්‍යාපෘතිය සඳහා සිය අනුමැතිය නොදෙන්නන් ගේ සංගණන තොරතුරු සංඛ්‍යානමය ක්‍රියාවලිය අවසන්වීමෙන් පසු, ඔස්ට්‍රේලියානු දත්ත කාර්යංශයේ සාමාන්‍ය ක්‍රියා මාර්ගයන්ගෙන් අනතුරුව, විනාශ කෙරෙනු ඇත.

## සංගණනය සිදුවන අයුරු

සංචාරකයින්ද ඇතුළුව, සංගණන රාත්‍රියේ (අගෝස්තු 08 වන අඟහරුවාදා), සිටිනා කුමන හෝ ස්ථානයකදී ඔස්ට්‍රේලියාවේ සිටින සියල්ලෝම ගණනයට භාජනය වෙති. සංගණන රාත්‍රියට සති දෙකකට පෙර සංගණන රැස් කරන්නකු විසින් සංගණන පෝරමය සහ ඒ සඳහා වන උපදෙස් පත්‍රිකාවක් ඔබේ නිවසට භාරදෙනු ලබන අතර සංගණන රාත්‍රියෙන් සති දෙකකට පසු සම්පූර්ණ කරන ලද පත්‍රිකාව ආපසු ගෙන යාමට නැවත පැමිණෙනු ඇත. 2006 සංගණනය සඳහා නිවැසියන් හට සංගණන පෝරමය අන්තර්ජාලය මගින් සම්පූර්ණ කිරීමේ විකල්පයක්ද ඇත.

## සහය අවශ්‍යද ?

ජූලි මස අග සිට ඔස්ට්‍රේලියාව තුල වැඩි වශයෙන් භාවිතා වන භාෂාවන්ට ආධාර වන සංගණන විමසීම් සේවාවක් සැපයෙනු ඇත. මේ සංගණන විමසීම් සේවා භාෂා දුරකථන සහන සේවයන් පෙ.ව 8:30 සිට ප.ව 8:00 දක්වා දුරකථන අංක **1300 363 365** ඔස්සේ ක්‍රියාත්මක වනු ඇත.

භාෂා කුසලතා ඇති සංගණන රැස් කරන්නන් සුදුසු ප්‍රදේශවල සේවයේ නියුක්ත කොට ඇත. ආධාර දීම සඳහා ඔවුන් පුහුණු කොට ඇත. සංගණන වෙබ් අඩවිය – **www.abs.gov.au/census** - හි ද යම් යම් පරිවර්තිත දත්තයන් අඩංගු විය හැක.

**මතක තබාගන්න - සංගණනය ඔබේ ගනණය වීම සඳහා අවස්ථාවයි.**